ආරක්ෂිත පිරිත් දේශනාව

THE PROTECTIVE BLESSING

මංගල සූත්‍රය Mangala Sutta

රතන සූත්‍රය Ratana Sutta

කරණීය මෙත්ත සූත්‍රය Karaniya Metta Sutta

කුඩාගල කෝවිද හිමි
Ven. Kudagala Kovida

Printed and donated by

The Corporate Body of the Buddha Educational Foundation

11th Floor, 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website: http://www.budaedu.org

This book is strictly for free distribution, it is not to be sold.

නොමිලයේ බෙදාදීම පිණිසයි.

Dedication

I Would like to dedicate this booklet to the memory of those who had preserved these discourses through the centuries and to those who would preserve them in the future.

Ven Kudagala Kovida
June 2005.

කැප කිරීම

සියවස් ගණනක් තිස්සේ මේ පිරිත් දේශනා රැකගෙන ආ පිරිසටත් අනාගතයේ එය ආරක්‍ෂා කරන පිරිසටත් මෙම පොත දහම් පඬුරක් ලෙස කැප කරමි.

කුඩාගල කෝවිද හිමි
2005 ජුනි.

නමස්කාරය

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.

Namō Tassa Bhagavatō Arahatō Sammā Sambuddhassa.
Namō Tassa Bhagavatō Arahatō Sammā Sambuddhassa.
Namō Tassa Bhagavatō Arahatō Sammā Sambuddhassa.

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්ම සාරථී සත්ථා දේව මනුස්සානං බුද්ධෝ භගවාති.

Itipi sō Bhagavā Arahaṅ Sammā Sambuddhō Vijjācharana Sampannō Sugatō Lōkavidū Anuttarō Purisadamma Sārathi Sattā Dēva Manussānaṅ Buddhō Bhagavāti.

ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ සංදිට්ඨිකෝ අකාලිකෝ ඒහිපස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති.

Svākkhātō Bhagavatā Dhammō Saṅditthikō akālikō ēhipassikō ōpanayikō pachchattaṅ vēditabbō viññūhītī.

Meaning - තේරුම

ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා.
ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා.
ඒ භාග්‍යවත් අරහත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා.

Homage to the Lord, the Worthy One, the Perfectly Enlightened One.
Homage to the Lord, the Worthy One, the Perfectly Enlightened One.
Homage to the Lord, the Worthy One, the Perfectly Enlightened One.

ඒ භාග්‍යවතුන් වහන්සේ සියළු පූජාවන් ලැබීමට සුදුසුය, යන අර්ථයෙන් අරහත් නම් වන සේක. සියල්ල තමන් ගේ ඥාණයෙන්ම මනා කොට දැනගත් සේක. ප්‍රඥාවෙන් සහ සීල ආදී චරණ ධර්ම වලින් සම්පූර්ණ වන සේක. යහපත් වචනයෙන් හා ගමනින් යුක්ත වන සේක. ලෝකය දන්නා සේක. අන් අයට හික්මවන්නට නොහැකි වූවන් හික්මවීමෙහි සමර්ථ වන සේක. දෙව් මිනිසුන් සහිත සියල්ලන්ටම ගුරු වූ සේක. සත්‍ය අවබෝධ කළ සේක. සියළු පව් නැසූ සේක.

Thus indeed, is that Blessed One; He is the Holy One; Fully Enlightened; endowed with clear vision and virtuous conduct, sublime, knower of worlds, the incomparable leader of men to be tamed, the teacher of gods and men, Enlightened and Blessed.

බුදුරජාණන් වහන්සේ විසින් ධර්මය මනා කොට දේශනා කරන ලද්දේය. එය තමා ගේ නුවණින්ම දැක්ක යුතුය. කල් නොයවා විපාක දෙන්නේය. එන්න මේ බලන්නැයි අන්‍යයන් කැඳවා දැක්වීමට තරම් උතුම් ගුණ ඇත්තේය. තමා ගේ සිතින් එලඹීමට සිතට අරමුණු කිරීමට සුදුසුය. නුවණැත්තන් විසින් තම තමන් කෙරෙහි ලා දත යුත්තේය.

The Dhamma of the Blessed One is perfectly expounded; to be self realised, not delayed in time; inviting one to come and see; for one self, onward leading to Nibbāna, to be known by the wise each for himself/herself.

සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ
උජුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ
ඤායපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ
සාමීචිපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ
යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා
ඒස භගවතෝ සාවක සංඝෝ
ආහුණෙය්‍යෝ පාහුණෙය්‍යෝ දක්ඛිණෙය්‍යෝ අංජලිකරණීයෝ
අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සාති.

Supatipannō Bhagavatō Sāvaka Saṅghō
Ujupatipannō Bhagavatō Sāvaka Saṅghō
Ñāyapatipannō Bhagavatō Sāvaka Saṅghō
Sāmichipatipannō Bhagavatō Sāvaka Saṅghō
Yadidaṅ chattāri purisayugāni attha purisa puggalā
Esa Bhagavatō Sāvaka Saṅghō
Āhuneyyō pāhuneyyō dakkhineyyō aṅjalikaranīyō
Anuttaraṅ puññakkhettaṅ lōkassāti

ඒතේන සච්ච වජ්ජේන සොත්ථිතේ හෝතු සබ්බදා.
ඒතේන සච්ච වජ්ජේන සබ්බ රෝගෝ විනස්සතු.
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජය මංගලම්.

Ētēna sachcha vajjēna sotthitē hōtu sabbadā.
Ētēna sachcha vajjēna sabba rōgō vinassatu.
Ētēna sachcha vajjēna hōtu tē jaya maṅgalam.

භාග්‍යවතුන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝ තෙමේ මැනවින් ගුණධර්ම පිළිපැදීම නැමැති ආර්ය මාර්ගයට පිළිපන්නේය. ඇද නැති ධර්ම මාර්ගයෙහි ගමන් කරන්නේය. නිවන් මගට පිවිසියේය. නිවන් ලැබීමට සුදුසු ප්‍රතිපත්තියට පිවිසියේය. ඒ සංඝයා වහන්සේලා පුරුෂ යුග වශයෙන් අට දෙනෙකි. භාග්‍යවතුන් වහන්සේ ගේ මේ ශ්‍රාවක සංඝ තෙමේ දුරසිට ගෙනවුත් පුදන සිව්පසය ලැබීමට සුදුසුය. පරලොව සඳහා දියයුතු දන් ලබන්නට සුදුසුය. දොහොත් මුදුන් තබා වැඳීමට සුදුසුය. ලෝවැසියන්ට උතුම් පින්වල හටගන්වන පිං කෙතකි.

The Saṅgha of the Blessed One's Disciples has entered on the good way; the Saṅgha of the Blessed One's Disciples has entered on the straight way; the Saṅgha of the Blessed One's Disciples has entered on the true way; the Saṅgha of the Blessed One's Disciples has entered on the proper way; that is to say; the four pairs of Men; the eight types of Persons; the Saṅgha of the Blessed One's Disciples is fit for gifts; fit for hospitality; fit for offerings, and fit for reverential salutation; as an incomparable field of merit to the world.

මේ සත්‍ය වචනයේ බලයෙන් සැමදා ඔබට යහපතක්ම වේවා !
මේ සත්‍ය වචනයේ බලයෙන් සියළු රෝග නැති වේවා !
මේ සත්‍ය වචනයේ බලයෙන් ඔබට දියුණුවක්ම වේවා !

On account of this Truth may there be happiness with you forever!
On account of this Truth may you be healed from all sicknesses!
On account of this Truth may the blessings be with you !

5

මහා මංගල සූත්‍රය
MAHAMANGALA SUTTA
Discourse on Blessing

ඒවං මේ සුතං. ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. අථ ඛෝ අඤ්ඤතරා දේවතා අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා කේවලකප්පං ජේතවනං ඕභාසෙත්වා, යේන භගවා තේනුපසංකමි. උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි. ඒකමන්තං ඨිතා ඛෝ සා දේවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි ~~.

Ēvaṅ mē sutaṅ. Ēkaṅ samayaṅ Bhagavā Sāvatthiyaṅ Viharati Jetavanē Anāthapindikassa Āramē. Atha khō aññatarā dēvatā abhikkantāya rattiyā abhikkantavannā kēvalakappaṅ Jētavanaṅ ōbhāsetvā, yēna Bhagavā tēnupasaṅkami. Upasaṅkamitvā Bhagavantaṅ abhivādetvā ēkmantaṅ atthāsi. Ēkamantaṅ thitā khō sā devatā Bhagavantaṅ gāthāya ajjhabhāsi~~.

1. බහූදේවා මනුස්සා ච - මංගලානි අචින්තයුං
ආකංඛමානා සොත්ථානං - බ්‍රෑහි මංගල මුත්තමං.

1. Bahūdēvā manussā cha - Maṅgalāni achintayuṅ
Ākaṅkhamānā sotthānaṅ - Bhrūhi maṅgala muttamaṅ.

2. අසේවනා ච බාලානං - පණ්ඩිතානං ච සේවනා
පූජා ච පූජනීයානං - ඒතං මංගල මුත්තමං.

2. Asēvanā cha bālānaṅ - Panditānaṅ cha sēvanā
Pūjā cha pū janīyānaṅ - Ētaṅ maṅgala muttamaṅ.

3. පතිරූපදේසවාසෝ ච - පුබ්බේ ච කතපුඤ්ඤතා
අත්තසම්මාපණිධි ච - ඒතං මංගල මුත්තමං

3. Patirūpadēsavāsō cha - Pubbē cha katapuññatā
Attasammāpanīdhī cha - Ētaṅ maṅgala muttamaṅ.

6

දේශනාවේ තේරුම
Meaning of the Discourse

මා විසින් (ආනන්ද හිමි විසින්) මේ සූත්‍ර දේශනය මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුතුමාගේ ආරාමයේ වැඩ වසන සේක. එකල්හි එක්තරා දෙවියෙක් ප්‍රථම යාමය ඉකුත් වූ කල්හි යහපත් ශරීර වර්ණ ඇතිව සියළු ජේතවනය බබුළුවාගෙන යම් තැනක භාග්‍යවතුන් වහන්සේ වසන සේක්ද එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ දෙවියා ගාථාවකින් උන්වහන්සේට මෙසේ ආමන්ත්‍රණය කළේය ~~.

Thus it has been heard by me (Venerable Ānanda). Once upon a time the Lord was sojourning in Sāvatthi in Jeta's grove at the monastery of Anāthapindika. Then, indeed, when the night was advanced a certain deity, in surpassing colour, making radiant the whole of Jeta's grove, approached where the Lord was. Having approached and worshipped the Lord (he) sat on a side. That deity, having sat on a side spoke to the Lord in a stanza~~.

1. මෙලොව පරලොව දෙකෙහි සැප පතන්නා වූ බොහෝ දෙවියෝ ද මනුෂ්‍යයෝ ද මංගලයන් සිතූහ (දෙවියන්ගේ අනුමතය ඇතිව මනුෂ්‍යයන් කෙරෙහි අනුග්‍රහයෙන් මා විසින් ප්‍රශ්න කරන ලද භාග්‍යවතුන් වහන්සේ අප හැමට අනුකම්පා පිණිස) උතුම් මංගල කරුණු වදාරනු මැනවි.

1. Many Gods and men - Thought about the blessings
Wishing happiness - Please say what the highest blessing is.

2. බාලයන් ඇසුරු නොකිරීමද - පණ්ඩිතයන් ඇසුරු කිරීමද
පිදිය යුත්තන් පිදීමද - මෙය දියුණුවට කරුණකි.

2. Non association of fools - Association of the wise
Respecting the respectable - This is the highest blessing.

3. සුදුසු ප්‍රදේශයක විසීම ද - පෙර කළ පිං ඇති බව ද
සිය සිත මනාව පිහිටුවීම ද - මෙය දියුණුවට කරුණකි.

3. Living in a suitable location - Having merit performed before
Establishing the self perfectly - This is the highest blessing.

4. බාහුසච්චඤ්ච සිප්පඤ්ච - විනයෝ ච සුසික්ඛිතෝ
සුභාසිතා ච යා වාචා - ඒතං මංගල මුත්තමං.

4. Bāhusachchañ cha sippañ cha - Vinayō cha susikkhitō
Subhāsitā cha yā vāchā - Ētaṅ maṅgala muttamaṅ.

5. මාතාපිතු උපට්ඨානං - පුත්තදාරස්ස සංගහෝ
අනාකුලා ච කම්මන්තා - ඒතං මංගල මුත්තමං.

5. Mātāpitū upatthānaṅ - puttadārassa saṅgahō
Anākulā cha kammantā - Ētaṅ maṅgala muttamaṅ

6. දානං ච ධම්මචරියා ච - ඤාතකානං ච සංගහෝ
අනවජ්ජානි කම්මානි - ඒතං මංගල මුත්තමං.

6. Dānaṅ cha Dhammachariyā cha - Ñātakānaṅ cha saṅgahō
Anavajjāni kammānī - Ētaṅ maṅgala muttamaṅ.

7. ආරති විරති පාපා - මජ්ජපානා ච සඤ්ඤමෝ
අප්පමාදෝ ච ධම්මේසු - ඒතං මංගල මුත්තමං.

7. Ārati virati pāpā - Majjapānā cha saññamō
Appamādō cha Dhammēsu - Ētaṅ maṅgala muttamaṅ.

8. ගාරවෝ ච නිවාතෝ ච - සන්තුට්ඨි ච කතඤ්ඤුතා
කාලේන ධම්ම සවණං - ඒතං මංගල මුත්තමං.

8. Gāravō cha nivātō cha - Santutthī cha kataññutā
Kālēna Dhamma savanaṅ - Ētaṅ maṅgala muttamaṅ.

4. බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව ද, ශිල්ප දැනීම ද - මනාව හික්මුණු බව ද - සුභාෂිත වචන කථා කිරීම ද - මෙය දියුණුවට කරුණකි.

4. Profound knowledge and (being) learned in the arts - disciplined, well trained - that word which is well spoken-This is the highest blessing.

5. මව් පිය උපස්ථානය ද - අඹුදරුවන්ට සංග්‍රහ කිරීම ද නිරවුල් කර්මාන්ත කිරීම ද - මෙය දියුණුවට කරුණකි.

5. Attending on the mother and father - looking after the wife and children - blameless occupation - This is the highest blessing.

6. දන් දීම ද, දස කුශලයෙහි හැසිරීම ද - නෑයන්ට සංග්‍රහ කිරීම ද - නිවැරදි ක්‍රියා කිරීම ද - මෙය දියුණුවට කරුණකි.

6. Generosity and living the noble life - looking after the relatives- faultless actions - This is the highest blessing.

7. පාපයෙහි නොඇල්ම හා පවින් වැළැක්ම ද - මත් පැනින් වැළකීම ද - කුශල ධර්මයෙහි අප්‍රමාදය ද - මෙය දියුණුවට කරුණකි.

7. Leaving off and abstinence from evil - restraint in intoxicants- watchfulness in (good) acts - This is the highest blessing.

8. ගරුකල යුත්තන්ට ගරු කිරීම ද, යටහත් පහත් පැවතුම් ඇති බව ද - ලද දෙයින් සතුටු වීම ද, කලගුණ දන්නා බව ද - සුදුසු කාලයෙහි බණ ඇසීම ද - මෙය දියුණුවට කරුණකි.

8. Respect (for the respectable), humility contentment and gratitude - listening to the Doctrine at the proper time - This is the highest blessing.

9. **ඛන්ති ච සෝවචස්සතා - සමණානං ච දස්සනං**
කාලේන ධම්ම සාකච්ඡා - ඒතං මංගල මුත්තමං.

9. Khantī cha sōvachassatā - Samanānaṅ cha dassanaṅ
Kālēna Dhamma sākachchā - Ētaṅ maṅgala muttamaṅ.

10. **තපෝ ච බ්‍රහ්මචරියං ච - අරියසච්චාන දස්සනං**
නිබ්බාන සච්ජිකිරියා ච - ඒතං මංගල මුත්තමං.

10. Tapō cha brahmachariyaṅ cha - Ariyasachchāna dassanaṅ
Nibbāna sachchikiriyā cha - Ētaṅ maṅgala muttamaṅ.

11. **ඵුට්ඨස්ස ලෝකධම්මේහි - චිත්තං යස්ස න කම්පති**
අසෝකං විරජං ඛේමං - ඒතං මංගල මුත්තමං.

11. Phutthassa lōkadhammēhi - Chittaṅ yassa na kampatī
Asōkaṅ virajaṅ khēmaṅ - Ētan maṅgala muttamaṅ.

12. **ඒතාදිසානි කත්වාන - සබ්බත්ථ මපරාජිතා**
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති - තං තේසං මංගල මුත්තමංතී.

12. Etādisāni katvāna - Sabbattha maparājitā
Sabbattha sotthiṅ gachchantī -
Taṅ tēsaṅ maṅgala muttamaṅtī.

ඒතේන සච්ච වජ්ජේන සොත්ථිතේ හෝතු සබ්බදා.
ඒතේන සච්ච වජ්ජේන සබ්බ රෝගෝ විනස්සතු.
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජය මංගලම්.

Ētēna sachcha vajjēna sotthitē hōtu sabbadā.
Ētēna sachcha vajjēna sabba rōgō vinassatu.
Ētēna sachcha vajjēna hōtu tē jaya maṅgalam.

9. ඉවසීම ද, කීකරුකම ද - ශ්‍රමණයන් වහන්සේලා දැකීම ද
සුදුසු කාලයෙහි ධර්ම සාකච්ඡා කිරීම ද - මෙය දියුණුවට කරුණකි.

9. Forbearance and suavity - the sight of recluses
Discussion on the Doctrine at the proper time - This is the highest blessing.

10. සීලය ද, යහපත් හැසිරීම ද - චතුරාර්ය සත්‍ය අවබෝධය ද,
නිවන් ප්‍රත්‍යක්ෂ කිරීම ද - මෙය දියුණුවට කරුණකි.

10. Austerity and living a noble life (i.e. chastity), - perception of the four noble truths - realisation of Nibbana (emancipation)- This is the highest blessing.

11. අෂ්ටලෝක ධර්මයෙන් යමෙකු ගේ සිත කම්පා නොවේ ද,
එහෙයින්ම ශෝක රහිත ද, රාගාදී කෙලෙස් රහිත ද,
නිර්භය ද - මෙය දියුණුවට කරුණකි.

11. When affected by worldly conditions if one's mind does not tremble - (That is) free from sorrow, free from taint and safe - This is the highest blessing.

12. අසත්පුරුෂයන් ඇසුරු නොකිරීම ආදී මෙබඳු මංගලයන් කොට සියළු තැන නොපැරදී සියළු තැන සැපතට යෙදේ ද එය ඔවුන්ට උතුම් මංගලය වේ.

12. Having done what has been aforesaid - Undefeated everywhere they go everywhere to happiness.- This is the highest blessing for them.

මේ සත්‍ය වචනයේ බලයෙන් සැමදා ඔබට යහපතක්ම වේවා.
මේ සත්‍ය වචනයේ බලයෙන් සියලු රෝග නැති වේවා.
මේ සත්‍ය වචනයේ බලයෙන් ඔබට දියුණුවක්ම වේවා.

On account of this Truth may there be happiness with you forever.
On account of this Truth may you be healed from all Sicknesses.
On account of this Truth may the blessings be with you.

රතන සූත්‍රය
Ratana Sutta
Discourse on the Jewels

1. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
සබ්බේව භූතා සුමනා භවන්තු
අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං.

1. Yānīdha bhūtāni samāgatānī
Bhummāni vā yāniva antalikkhē
Sabbēva bhūtā sumanā bhavantū
Athōpi sakkachcha sunantu bhāsitaṅ.

2. තස්මාහි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවාච රත්තෝච හරන්ති යේ බලිං
තස්මාහි නේ රක්ඛථ අප්පමත්තා.

2. Tasmāhi bhūtā nisāmētha sabbē
Mettaṅ karōtha mānusiyā pajāya
Divācha rattōcha haranti yē baliṅ
Tasmāhi nē rakkhatha appamattā.

3. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගේසු වා යං රතනං පණීතං
න නෝ සමං අත්ථි තථාගතේන
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු.

3. Yaṅ kiñchi vittaṅ idha vā huraṅ vā
Saggēsu vā yaṅ ratanaṅ panītaṅ
Na nō samaṅ atthi Tathāgatēna
Idampi Buddhē ratanaṅ panītaṅ
Ētēna sachchēna suvatthi hōtu.

දේශනාවේ තේරුම
Meaning of the Discourse

1. භූමියෙහි හෝ අහසෙහි හෝ වසන යම් යම් භූතයෝ මෙහි රැස්ව සිටිත් ද, ඒ අමනුෂ්‍යයෝ හැම දෙනෙක්ම සතුටු සිත් ඇත්තෝ වෙත්වා! තව ද මා කියන දේ හොඳින් අසත්වා!~~.

(The Lord spoke)

1. Whatever spirits that are assembled here
Those of the earth or those of the air
May all those spirits be happy!
Furthermore, may they carefully listen to my words~~.

2. අමනුෂ්‍යයෙනි! තොපි සියල්ලෝම මගේ බසට කන් දෙවු! මනුෂ්‍ය ප්‍රජාවට මෛත්‍රී කරවු! රෑ දහවල් දෙක්හි ඔබට පුද පූජා පවත්වන මිනිසුන් අප්‍රමාදව ආරක්‍ෂා කරවු!

2. Therefore indeed, all the spirits listen!
Have loving kindness towards the human beings,
Who make offerings to you day and night.
Therefore indeed, protect them diligently.

3. මෙලොව හෝ වෙන යම්කිසි ලොවක හෝ දිව්‍ය ලෝකවල හෝ යම් උතුම් රත්නයක් වේ ද, තථාගත රත්නයට වඩා උතුම් රත්නයක් ඒ කිසි තැනක නැත. බුදුරදුන් කෙරෙහි මේ උතුම් රත්න භාවය පවතී. මෙය සත්‍යයකි. මේ සත්‍ය බලයෙන් සෙත් වේවා.

3. Whatever wealth there is in here or in another world
Or whatever excellent jewel there is in the heavens
There is none equal to the Wayfarer (the Buddha).
This jewel (found) in the Buddha is excellent.
On account of this truth may there be happiness (to all beings.)

4. ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ
න තේන ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු.

4. Khayaṅ virāgaṅ amataṅ panītaṅ
Yadajjhagā Sakyamunī samāhitō
Na tēna Dhammēna samatthi kiñchī
Idampi Dhammē ratanaṅ panītaṅ
Ētēna sachchēna suvatthi hōtu.

5. යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තේන සමෝ න විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු.

5. Yaṅ Buddhasetthō parivannayī suchiṅ
Samādhimānantarikaññamāhū
Samādhinā tēna samō na vijjatī
Idámpi Dhammē ratanaṅ panītaṅ
Ētēna sachchēna suvatthi hōtu.

6. යෙ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
ඒතේසු දින්නානි මහප්ඵලානි
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු.

6. Ye puggalā attha sataṅ pasatthā
Chattāri ētāni yugāni hontī
Tē dakkhineyyā Sugatassa sāvakā
Ētēsu dinnāni mahapphalānī
Idampi Saṅghē ratanaṅ panītaṅ
Ētēna sachchēna suvatthi hōtu.

4. එකඟ වූ සිත් ඇති ශාක්‍ය මුණින්ද්‍රයන් වහන්සේ කෙළෙස් නැති කරන, රාග නැති කරන, අමෘත වු යම් නිර්වාණ ධර්මයක් අවබෝධ කල සේක් ද, ඒ ධර්මය හා සමාන අන් කිසිවක් නැත. ඒ ධර්මයෙහි උතුම් වු රත්න භාවය පවතී. ඒ සත්‍ය බලයෙන් සෙත් වේවා.

4. Cessation, dispassion, immortality and excellence that the Nibbana the Sakyan Sage, composed and attained. There is nothing equal to that Dhamma. This jewel in the Dhamma is excellent. On account of this truth may there be happiness.

5. ශ්‍රේෂ්ඨ වු බුදුරජාණන් වහන්සේ යමක් පිරිසිදු යැයි වර්ණනා කළ සේක් ද, යම් ආර්ය මාර්ගයක් කල් නොයවාම විපාක දෙන සමාධි යයි කී සේක් ද, ඒ සමාධිය හා සමාන අන් කිසිවක් නැත. ධර්මයෙහි මේ උතුම් රත්න භාවය පවතී. ඒ සත්‍ය බලයෙන් සෙත් වේවා.

5. That which pure path the Great Buddha praised; That concentration which they say is immediately following; There is nothing equal to that concentration. This jewel in the Dhamma is excellent. On account of this truth may there be happiness.

6. යම් ආර්ය පුද්ගලයෝ අට දෙනෙක් සත් පුරුෂයන් විසින් පසස්නා ලද්දාහු ද, ඔවුහු යුග වශයෙන් හතර දෙනෙක් වෙති. බුද්ධ ශ්‍රාවක වූ උන්වහන්සේලා දක්ෂිණාව පිළිගැනීමට සුදුස්සෝ වෙති. උන්වහන්සේලාට දුන් දෙය මහත් ඵල වෙයි. සංඝයා කෙරෙහි මේ උතුම් රත්න භාවය පවතී. ඒ සත්‍ය බලයෙන් සෙත් වේවා.

6. Those Eight Individuals praised by the wise constitute four pairs. Those disciples of the Wayfarer are worthy of gifts. What is given to them bear great fruits. This jewel in the Saṅgha is excellent. On account of this truth may there be happiness.

7. යේ සුප්පයුත්තා මනසා දළ්හේන
නික්කාමිනෝ ගෝතම සාසනම්හි
තේ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු.

7. Yē suppayuttā manasā dalhēna
Nikkāminō Gōtama sāsanamhī
Tē pattipattā amataṅ vigaiha
Laddhā mudhā nibbutiṅ bhuñjamānā
Idampi Saṅghē ratanaṅ panītaṅ
Ētēna sachchēna suvatthi hōtu.

8. යථින්දඛීලෝ පඨවිංසිතෝසියා
චතුබ්භි වාතේභි අසම්පකම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි
යෝ අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු.

8. Yathindakhīlō pathaviṅsitōsiyā
Chatubbhi vātēbhi asmpakampiyō
Tathūpamaṅ sappurisaṅ vadāmi
Yō Ariyasachchani avechcha passatī
Idampi Saṅghē ratanaṅ panītaṅ
Ētēna sachchēna suvatthi hōtu.

9. යේ අරියසච්චානි විභාවයන්ති
ගම්භීරපඤ්ඤේන සුදේසිතානි
කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා
න තේ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු.

9. Yē ariyasachchāni vibhāvayantī
Gambhīrapaññēna sudēsitānī
Kiñchāpi tē honti bhusappamattā
Na tē bhavaṅ atthamaṅ ādiyantī
Idampi Saṅghē ratanaṅ panītaṅ
Ētēna sachchēna suvatthi hōtu.

7. යම් කෙනෙක් බුදු සසුනෙහි හොඳින් සිල් රැකගෙන, ස්ථිර සිත් ඇතිව, සියළු කෙලෙසුන් ගෙන් තුරන්ව, තමන් පැමිණිය යුතු නිවනට පැමිණ, නිවන් සැප වළඳත් ද, ඒ සංඝයා කෙරෙහි උතුම් රත්න භාවය පවතී. ඒ සත්‍යයෙන් සෙත් වේවා!

7. Those well engaged with a firm heart free from passion, in the dispensation of Gōtama. They have reached the goal (Nibbāna) and plunged into immorality. Having received free they enjoy peace. This jewel in the Saṅgha is excellent. On account of this truth may there be happiness.

8. පොළවෙහි ඉතා ගැඹුරින් සිටුවන ලද ඉන්ද්‍රඛීලය නම් වූ කණුව සතර දිගින් හමන සුළඟින් සෙලවිය නොහැක්කාක් මෙන් ආර්ය සත්‍යය මනා කොට නුවණින් අවබෝධ කර ගත් සත්පුරුෂ සංඝයා ද කිසිවකින් කම්පා නොවේ. මේ ශ්‍රේෂ්ඨ රත්න භාවය සංඝයා කෙරෙහි පවතී. ඒ සත්‍යයෙන් සෙත් වේවා!

8. Just as the Indra's post that is firmly fixed to the earth, cannot be shaken by the winds blowing from all four directions, even so a wise person who definitely realised the Noble Truths. This jewel in the Saṅgha is excellent. On account of this truth may there be happiness.

9. යම් කෙනෙක් ගැඹුරු නුවණ ඇති බුදුරදුන් විසින් මනාකොට දෙසන ලද ආර්ය සත්‍යයන් අවබෝධ කර ගනිත් ද, කිසි ලෙසකින් ඒ (සෝවාන්) පුද්ගලයෝ බොහෝ ප්‍රමාදයට පැමිණ අටවැනි උත්පත්තියක් ලබා නොගනිති. ආර්ය සංඝයා කෙරෙහි මේ උතුම් රත්න භාවය පවතී. ඒ සත්‍යයෙන් සෙත් වේවා!

9. Those who understand clearly the Noble truths, well expressed by the One who has deep wisdom, would never become exceedingly indolent and undergo an eighth existence. This jewel in the Saṅgha is excellent. On account of this truth may there be happiness.

10. සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨි විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතංවාපි යදත්ථි කිඤ්චි
චතූහපායේහි ච විප්පමුත්තෝ
ඡචාභි ඨානානි අභබ්බෝකාතුං
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු.

10. Sahāvassa dassanasampadāya
Tayassu dhammā jahitā bhavantī
Sakkāyaditthi vichikichchitañcha
Silabbataṅvāpi yadatthi kiñchi
Chatūhapāyēhi cha vippamuttō
Chachābhi thānāni abhabbōkātuṅ-
Idampi Saṅghē ratanaṅ panītaṅ
Ētēna sachchēna suvatthi hōtu.

11. කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං
කායේන වාචා උද චේතසා වා
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු.

11. Kiñchāpi sō kammaṅ karōti pāpakaṅ
Kāyēna vāchā uda chētasā vā
Abhabbō sō tassa patichchādāya
abhabbatā ditthapadassa vuttā
Idampi Saṅghē ratanaṅ panītaṅ
Ētēna sachchēna suvatthi hōtu.

10. ඔවුහු සෝවාන් මගට පැමිණීමත් සමගම ආත්ම දෘෂ්ටිය, සැකය, සීල හා ව්‍රත පිළිබඳ අනෙක් විශ්වාස ද යන සංයෝජන ධර්ම තිදෙන ප්‍රහීණ කළාහු වෙති. ඔවුහු සතර අපායෙන් ද, සවැදෑරුම් බරපතල පව් කිරීමෙන් ද නිදහස් වූවෝ වෙති. ආර්ය සංඝයා කෙරෙහි මේ උතුම් රත්න භාවය පවතී. ඒ සත්‍යයෙන් සෙත් වේවා.

10. Together with his attainment of insight,
Three qualities have been abandoned;
Belief in self-illusion, doubt
and acceptance of wrong beliefs.
He is freed from the four states of suffering
In addition, is incapable of committing the six deadly crimes.
This jewel in the Saṅgha is excellent. On account of this truth
may there be happiness.

11. සෝවාන් පුද්ගල තෙමේ කයින්, වචනයෙන් හෝ සිතින් කිසියම් පවක් කෙරේ ද ඔහු එය සඟවන්නේ නැත. කළ වරද සැඟවීම නිවන් දුටු, සෝවාන් පුද්ගලයා ගේ සිරිත නොවේ. ආර්ය සංඝයා කෙරෙහි මේ උතුම් රත්න භාවය පවතී. ඒ සත්‍යයෙන් සෙත් වේවා.

11. Whatever bad deed he does (unknowingly),
Either by body, word or mind,
He is incapable of hiding it.
This incapability is said to be (that) of one who has seen the state of Nibbāna. This jewel in the Saṅgha is excellent. On account of this truth may there be happiness.

12. වනප්පගුම්බේ යථාඵුස්සිතග්ගේ
ගිම්හානමාසේ පඨමස්මිංගිම්හේ
තථූපමං ධම්මවරං අදේසයි
නිබ්බානගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු.

12. Vanappagumbē yathāphussitaggē
Gimhānamāsē pathamasmiṅgimhē
Tathūpamaṅ Dhammavaraṅ adēsai
Nibbānagāmiṅ paramaṅ hitāya
Idampi Buddhē ratanaṅ panītaṅ
Ētēna sachchēna suvatthi hōtu.

13. වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයි
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු.

13. Varō varaññū varadō varāharō
Anuttarō Dhammavaraṅ adēsaī
Idampi Buddhē ratanaṅ panītaṅ
Ētēna sachchēna suvatthi hōtu.

14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකේ භවස්මිං
තේ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා
නිබ්බන්ති ධීරා යථායම්පදීපෝ
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු.

14. Khīnaṅ purānaṅ navaṅ natthi sambhavaṅ
Virattachittā āyatikē bhavasmiṅ
Tē khīnabījā avirūlhichchandā
Nibbanti dhīrā yathāyampadīpō
Idampi Saṅghē ratanaṅ panītaṅ
Ētēna sachchēna suvatthi hōtu.

12. ග්‍රීෂ්ම සෘතුවෙහි ප්‍රථම මාසයෙහි පිපුණු මල් ඇති වන ලැහැබක් යම් සේ බබළා ද, එසේ ස්කන්ධ ධාතු, ආයතන වැනි නානාවිධ පුෂ්ප ජාති වලින් පිරිපුන් නිවන් මගට පමුණුවන උතුම් ධර්මය බුදුරජාණන් වහන්සේ දෙසු සේක. ඒ බුදුරදුන් කෙරෙහි මේ උතුම් රත්න භාවය පවතී. ඒ සත්‍යයෙන් සෙත් වේවා.

12. Just as a forest is flowered at the top During the first month of Summer, Similarly He propounded the Noble Dhamma Which leads to Nibbāna for the highest benefit. This jewel in the Buddha is excellent. On account of this truth may there be happiness.

13. උත්තම වූ නිවන දන්නාවූ, උත්තම වූ නිවන දෙන්නාවූ, උත්තම වූ නිවන් මගට පමුණුවන්නා වූ, තමන්ට වඩා උත්තමයෙක් නැත්තා වූ බුදුරජාණන් වහන්සේ උතුම් වූ ධර්මය දෙසූ සේක. බුදුරදුන් කෙරෙහි මේ උතුම් රත්න භාවය පවතී. ඒ සත්‍යයෙන් සෙත් වේවා.

13. The Noble One, the knower of what is noble, the giver of what is noble, and the taker of what is noble, The unsurpassed one delivered the noble Dhamma.
This jewel in the Buddha is excellent. On account of this truth may there be happiness.

14. පුරාණ කර්මයන් ගෙවී ගොස් ඇති, අළුත් කර්ම හට ගැනීමකුත් නැති, මතු භවයක් ගැන නොඇලුණු සිත් ඇති, නැවත ඉපදීම ක්ෂය කොට ඇති, වැඩෙන ආශා නැති, ඒ ධෛර්ය සම්පන්න රහතන් වහන්සේලා මේ පහන මෙන් නිවී යති. ආර්ය සංඝයා කෙරෙහි මේ උතුම් රත්න භාවය පවතී. ඒ සත්‍යයෙන් සෙත් වේවා.

14. The past has been destroyed, there is no becoming of the new, Their mind is unattached to a future existence,
They have destroyed the root (lit. the egg). Their desires are absent. Just as this lamp is blown out the wise ones become passionless. This jewel in the Saṅgha is excellent. On account of this truth may there be happiness.

15. යානීධ භූතානි සමාගතානී
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු.

15. Yānīdha bhūtāni samāgatānī
Bhummāni vā yāniva antalikkhē
Tathāgataṅ dēvamanussa pūjitaṅ
Buddhaṅ namassāma suvatthi hōtu.

16. යානීධ භූතානි සමාගතානී
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හෝතු.

16. Yānīdha bhūtāni samāgatānī
Bhummāni vā yāniva antalikkhē
Tathāgataṅ dēvamanussa pūjitaṅ
Dhammaṅ namassāma suvatthi hōtu.

17. යානීධ භූතානි සමාගතානී
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හෝතු.

17. Yānīdha bhūtāni samāgatānī
Bhummāni vā yāniva antalikkhē
Tathāgataṅ dēvamanussa pūjitaṅ
Saṅghaṅ namassāma suvatthi hōtu.

ඒතේන සච්ච වජ්ජේන සොත්ථිතේ හෝතු සබ්බදා.
ඒතේන සච්ච වජ්ජේන සබ්බ රෝගෝ විනස්සතු.
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජය මංගලම්.

Etēna sachcha Vajjēna sotthitē hōtu sabbadā.
Etēna sachcha vajjēna sabba rōgō vinassatu.
Etēna sachcha vajjēna hōtu tē jaya maṅgalam.

15. බිම වසන හෝ අහසෙහි වසන හෝ යම් යම් භූතයෝ මෙහි රැස්ව සිටිත් ද, ඒ අපි හැම දෙනම දෙවි මිනිසුන් විසින් පුදන ලද තථාගත නම් වූ බුදුරජාණන් වහන්සේට නමස්කාර කරමු. (සත්හට) සෙත් වේවා.

15. Whatever spirits, (we) that are assembled here,
Those of the earth or those of the air,
The Wayfarer, had been worshipped by gods and men.
May we worship the Buddha and may there be happiness.

16. බිම වසන හෝ අහසෙහි වසන හෝ යම් යම් භූතයෝ මෙහි රැස්ව සිටිත් ද, ඒ අපි හැම දෙනම දෙවි මිනිසුන් විසින් පුදන ලද ධර්මයට නමස්කාර කරමු. (සත්හට) සෙත් වේවා.

16. Whatever spirits, (we) that are assembled here,
Those of the earth or those of the air,
The Wayfarer, had been worshipped by gods and men.
May we worship the Dhamma and may there be happiness.

17. බිම වසන හෝ අහසෙහි වසන හෝ යම් යම් භූතයෝ මෙහි රැස්ව සිටිත් ද, ඒ අපි හැම දෙනම දෙවි මිනිසුන් විසින් පුදන ලද සංඝයාට නමස්කාර කරමු. (සත්හට) සෙත් වේවා.

17. Whatever spirits, (we) that are assembled here,
Those of the earth or those of the air,
The Wayfarer, had been worshipped by gods and men.
May we worship the Saṅgha and may there be happiness.

මේ සත්‍ය වචනයේ බලයෙන් සැමදා ඔබට යහපතක්ම වේවා.
මේ සත්‍ය වචනයේ බලයෙන් සියළු රෝග නැති වේවා.
මේ සත්‍ය වචනයේ බලයෙන් ඔබට දියුණුවක්ම වේවා.

On account of this Truth may there be happiness with you forever.
On account of this Truth may you be healed from all sicknesses.
On account of this Truth may the blessings be with you.

කරණීය මෙත්ත සූත්‍රය
Karaniya Metta Sutta
Discourse on Loving Kindness

1. කරණීයමත්ථ කුසලේන
යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කෝ උජූ ච සුජූ ච
සුවචෝ චස්ස මුදු අනතිමානී.

1. Karanīyamattha kusalēna
Yań tań santań padań abhisamechcha
Sakkō ujū cha sūjū cha
Suvachō chassa mudu anatimāni.

2. සන්තුස්සකෝ ච සුභරෝ ච
අප්පකිච්චෝ ච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියෝ ච නිපකෝ ච
අප්පගබ්භෝ කුලේසු අනනුගිද්ධෝ.

2. Santussakō cha subharō cha
Appakichchō cha sallahukavuttī
Santindriyō cha nipakō cha
Appagabbhō kulēsu ananugiddhō.

3. න ච ඛුද්දං සමාචරේ කිඤ්චි
යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං
සුඛිනෝ වා ඛෙමිනෝ හොන්තු
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා.

3. Na cha khuddań samācharē kiñchi
Yēna viññū parē upavadeyyuń
Sukhinō vā kheminō hontū
Sabbē sattā bhavantu sukhitattā.

දේශනාවේ තේරුම
Meaning of the Discourse

1. **ශාන්තපදය යි කියනු ලබන නිර්වාණයට පැමිණ වසනු කැමැත්තකු විසින් යමක් කළයුතු ද, අභිවෘද්ධියෙහි දක්‍ෂයා විසින් එය කළයුතුයි. ඔහු කුදු මහත් කාර්‍යයෙහි දක්‍ෂයෙක් වන්නේය, ඍජු ගති ඇත්තෙක් වන්නේය, මනාකොට ඍජු ගති ඇත්තෙක් වන්නේය, කීකරු තැනැත්තෙක් වන්නේය, මෘදුගුණ ඇත්තෙක් වන්නේය, අධික මාන නැත්තෙක් වන්නේය.**

1. He who is skilled in his own welfare and wishes to attain the quiet state (Nibbana) should act thus;
He should be able, straight and extremely straight.
He should be obedient, gentle (soft hearted) and free from pride.

2. **ලද දෙයින් සතුටු වන්නේය, අනුන් විසින් පහසුවෙන් පෝෂණය කළ හැක්කෙක් වන්නේය, ස්වල්ප කටයුතු ඇත්තෙක් වන්නේය, සැහැල්ලු පැවතුම් ඇත්තෙක් වන්නේය. සන්සුන් ඉඳුරන් ඇත්තෙක් වන්නේය. නුවණැත්තෙක් වන්නේය, නොසරුප්කම් නැත්තෙක් වන්නේය, කුලයන්හි නො ඇලුනෙක් වන්නේය.**

2. Self-contented, easy to support (not being a burden to others),
Have few duties and an extremely light livelihood.
And (he should be) calm in senses, prudent
Unobtrusive and should not attach to families.

3. **යම් ක්‍රියාවක් හේතුකොට ගෙන නුවණැති අන්‍යයෝ නින්දා කෙරෙත් ද, එබඳු කුඩා වරදකුදු නොකරන්නේය. සියලු සත්වයෝ සුවපත් වෙත්වා! නිර්භය වෙත්වා! සුඛිත සිත් ඇත්තෝ වෙත්වා!**

3. He should not involve even in any minute action,
That other wise ones would blame him.
May all beings be well and safe,
May all beings be of happy selves.

4. යේ කේචි පාණභූතත්ථි
තසා වා ථාවරා වා අනවසේසා
දීඝා වා යේ මහන්තා වා
මජ්ඣිමා රස්සකාණුකථූලා.

4. Yē kēchi pānabhūtatthī
Tasā vā thāvarā vā anavasēsā
Dīghā vā yē mahantā vā
Majjhimā rassakānūkathūlā.

5. දිට්ඨා වා යේව අද්දිට්ඨා
යේ ච දූරේ වසන්ති අවිදූරේ
භූතා වා සම්භවේසීවා
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා.

5. Ditthā vā yēva additthā
Yē cha dūre vasanti avidūrē
Bhūtā vā sambhavēsīvā
Sabbē sattā bhavantu sukhitattā.

6. න පරෝ පරං නිකුබ්බේථ
නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය.

6. Na parō paraṅ nikubbētha
Nātimaññētha katthachi naṅ kañchi
Byārōsanā patighasaññā
Nāññamaññassa dukkhamichcheyya.

7. මාතා යථා නියංපුත්තං
ආයුසා ඒකපුත්තමනුරක්ඛේ
ඒවම්පි සබ්බභූතේසු
මානසං භාවයේ අපරිමාණං.

7. Mātā yathā niyaṅputtaṅ
Āyusā ēkaputtamanurakkhē
Ēvampi sabbabhūtēsū
Mānasaṅ bhāvayē aparimānaṅ.

4. භයින් ත්‍රස්ත වූ හෝ නිර්භය හෙයින් ස්ථිර වූ හෝ යම්කිසි සියලු සත්ව කෙනෙක් වෙත් ද, දික් වූ සිරුරු ඇත්තා වූ හෝ මහත් වූ සිරුරු ඇත්තා වූ හෝ මධ්‍යම ප්‍රමාණ වූ හෝ ඉතා මිටි වූ හෝ සියුම් වූ හෝ ස්ථූල වූ සිරුරු ඇත්තා වූ හෝ යම් සත්වයෝ වෙත් ද,

4. Whatsoever living beings there may be,
Either trembling or firm,
Long or those who are huge,
Middle sized, short, atom-sized or fat,

5. ඇසට පෙනෙන්නා වූ හෝ නොපෙනෙන්නා වූ හෝ ඈත වසන්නා වූ හෝ ළඟ වසන්නා වූ හෝ යම් සත්වයෝ වෙත් ද, උපන්නා වූ හෝ ඉපදීමට සිටින්නා වූ හෝ යම් සත්වයෝ වෙත් ද ඒ සියලු සත්වයෝ සුවපත් වෙත්වා!

5. Those seen or unseen,
Those who live far or near,
Those who are born or those who are to be born,
May all beings be of happy selves.

6. කෙනෙක් අනිකකු කිසිතැනකත් නො රවටා වා කිසි තැනෙකත් කිසිවකුට අවමන් නො කෙරෙත්වා! කාය වාග් විකාරයෙන් වූ කෝපයෙන් ද, ද්වේශ හැඟීමකින් ද කෙනෙක් අනිකෙකුට දුකක් කැමති නොවෙත්වා!

6. May one not deceive,
Nor despise another anywhere,
Through anger or ill-will,
May one not wish suffering for another.

7. යම්සේ මවක් තමන් ගේ එකම දරුවා දිවි පුදා නමුත් රකින්නී ද, මෙසේ හැම සතුන් කෙරෙහි අප්‍රමාණ වූ මෙත් සිත වඩන්නේය.

7. Just as a mother,
Protects her own only child with her own life,
One should develop an unlimited thought of loving kindness
towards all beings.

8. මෙත්තං ච සබ්බලෝකස්මිං
මානසං භාවයේ අපරිමාණං
උද්ධං අධෝ ච තිරියඤ්ච
අසම්බාධං අවේරං අසපත්තං.

8. Mettaṅ cha sabbalōkasmiṅ
Mānasaṅ bhāvayē aparimānaṅ
Uddhaṅ adhō cha tiriyañcha
Asambādhaṅ avēraṅ asapattaṅ.

9. තිට්ඨං චරං නිසින්නෝ වා
සයානෝ වා යාවතස්ස විගතමිද්ධෝ
ඒතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු.

9. Titthaṅ charaṅ nisinno vā
Sayānō vā yāvatassa vigatamiddhō
Ētaṅ satiṅ adhittheyya
Brahmamētaṅ vihāraṅ idhamāhu.

10. දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා
දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං
නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතීති.

10. Ditthiñcha anupagamma sīlavā
Dassanēna sampannō
Kāmēsu vineyya gēdhaṅ
Nahi jātu gabbhaseyyaṅ punarētīti.

ඒතේන සච්ච වජ්ජේන සොත්ථිතේ හෝතු සබ්බදා.
ඒතේන සච්ච වජ්ජේන සබ්බ රෝගෝ විනස්සතු.
ඒතේන සච්ච වජ්ජේන හෝතු තේ ජය මංගලම්.

Ētēna sachcha vajjēna sotthitē hōtu sabbadā.
Ētēna sachcha vajjēna sabba rōgō vinassatu.
Ētēna sachcha vajjēna hōtu tē jaya maṅgalam.

8. සියලු ලෝකයා කෙරෙහි අප්‍රමාණ වූ මෙත් සිත වඩන්නේය. උඩ දිශාව ද, යට දිශාව ද, සරස ද, සීමාවක් නැතිව, වෛරයක් නැතිව, සතුරන් රහිතව මෙත් සිත වඩන්නේය.

8. Towards the whole world, develop unlimited thoughts of loving kindness;
Above, below and across,
With no obstruction, free from enmity and enemy-less.

9. යම්තාක් නොනිදා ද ඒතාක් සිටිමින් හෝ යමින් හෝ හිඳිමින් හෝ සැතපෙමින් හෝ මේ මෛත්‍රී සිත අධිෂ්ඨානයෙන් යුතුව වඩන්නේය. (බුද්ධාදී උතුමෝ) මෙය මේ ශාසනයෙහි බ්‍රහ්මවිහාර යයි කියත්.

9. Standing, walking, sitting,
Or lying down as long as one is awake,
One should determined to be mindful on loving kindness.
This they say, is the Brahma (holy) living (highest form of living).

10. මේ බඹ විහරණයෙන් යුත් ආර්‍ය ශ්‍රාවක තෙම මිථ්‍යා දෘෂ්ටියට නො පැමිණ, සිල් ඇති ව, දර්ශන නම් වූ සෝවාන් මාර්ගඥානයෙන් යුක්ත ව, කාමතෘෂ්ණාව දුරුකොට කිසිකලෙකත් නැවත මවු කුසක පිළිසිඳ ගැනුමට නො පැමිණෙන්නේය.

10. Without resorting to false views, being virtuous.
And endowed with insight,
Having disciplined against the greed for sensual pleasures,
He will not come again, indeed, to conceive in a womb.

මේ සත්‍ය වචනයේ බලයෙන් සැමදා ඔබට යහපතක්ම වේවා.
මේ සත්‍ය වචනයේ බලයෙන් සියළු රෝග නැති වේවා.
මේ සත්‍ය වචනයේ බලයෙන් ඔබට දියුණුවක්ම වේවා.

On account of this Truth may there be happiness with you forever.
On account of this Truth may be healed from all sicknesses.
On account of this Truth may the blessings be with you.

සබ්බීතියෝ විවජ්ජන්තු - සබ්බ රෝගෝ විනස්සතු
මාතේ බවත්වන්තරායෝ - සුඛී දීඝායුකෝ භව.

Sabbītiyō vivajjantū - Sabba rōgō vinassatū
Mātē bavatvantarāyō - Sukhī dīghāyukō bhava.

භවතු සබ්බ මංගලම් - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ බුද්ධානුභාවේන - සදා සොත්ථි භවන්තුතේ.

භවතු සබ්බ මංගලම් - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ ධම්මානුභාවේන - සදා සොත්ථි භවන්තුතේ.

භවතු සබ්බ මංගලම් - රක්ඛන්තු සබ්බ දේවතා
සබ්බ සංඝානුභාවේන - සදා සොත්ථි භවන්තුතේ.

Bhavatu sabba mangalaṅ - Rakkhantu sabba dēvatā
Sabba Buddhānubhāvēna - Sadā sotthi bavantutē.

Bhavatu sabba mangalaṅ - Rakkhantu sabba dēvatā
Sabba Dhammānubhāvēna - Sadā sotthi bavantutē.

Bhavatu sabba mangalaṅ - Rakkhantu sabba dēvatā
Sabba Saṅghānubhāvēna - Sadā sotthi bavantutē.

නක්කත්ත යක්ඛ භූතානං - පාපග්ගහ නිවාරණා
පරිත්තස්සානුභාවේන - හන්තු තේසං උපද්දවේ.

Nakkatta yakkha bhūtānaṅ - Pāpaggaha nivāranā
Parittassānubhāvēna - Hantu tēsaṅ upaddavē.

දේවෝ වස්සතු කාලේන - සස්ස සම්පත්ති හේතුච
ඵීතෝ භවතු ලෝකෝච - රාජා භවතු ධම්මිකෝ.

Dēvō vassatu kālēna - Sassa sampatti hētucha
Phītō bhavatu lōkōcha - Rājā bhavatu dhammikō.

සියළු නරක දුරු වේවා - සියළු රෝග නැති වේවා
කිසිදු අන්තරාවක් නොවේවා - සුවසේ දීගුකල් වෙසේවා.

May all misfortune be averted - May all sicknesses be healed
May no danger befall on you - May you live long happily.

සියළු දියුණුව උදාවේවා - සියළු දෙවියෝ රකිත්වා
සියළු බුදුවරුන්ගේ ආනුභාවයෙන් - සැමදා ඔබට යහපතක්ම වේවා.

සියළු දියුණුව උදාවේවා - සියළු දෙවියෝ රකිත්වා
සියළු ධර්මයේ ආනුභාවයෙන් - සැමදා ඔබට යහපතක්ම වේවා.

සියළු දියුණුව උදාවේවා - සියළු දෙවියෝ රකිත්වා
සියළු සංඝයාගේ ආනුභාවයෙන් - සැමදා ඔබට යහපතක්ම වේවා.

May all blessings accrue - May all deities protect you
By the glory of all Buddhas - May security ever be yours.

May all blessings accrue - May all deities protect you
By the glory of all Truth's laws - May security ever be yours.

May all blessings accrue - May all deities protect you
By the glory of all saintly disciples - May security ever be yours.

නැකැත්, යක්ෂ, භූත පාප ග්‍රහයින්ගෙන් සිදුවන සියළු උපද්‍රව පිරිතේ ආනුභාවයෙන් දුරුවේවා.

Of asterism's, yakkhas and demi gods;
For the warding off evil planets;
Through the power of the protections
May their dangers come to destruction.

සුදුසු කාලයේ වැසි වසීවා - භව භෝග දියුණු වේවා
ලෝ වැසියා සතුටු වේවා - රජවරු දැහැමි වෙත්වා.

May rain occur at the right time - May crops flourish
May people be happy - May the king be righteous.

Diacritical Marks

Please use the table below as a guide if you would like to know how to pronounce some of the Pāli words in English. (The English letters given with Pāli speech sounds in this booklet only represent corresponding sounds in English, and are not to be taken as equivalents).

1.	**Long vowel sounds are marked with (¯)**	
Eg:	ā	- as in star
		Please note if a Pāli word ends with an '**a**', it is pronounced as '**er**' - as in cover (except for the word **Na** where '**a**' is pronounced as '**u**' in but.)
	ē	- as in take
	ī	- as in need
	ō	- as in so
	ū	as in cool
2.	**Some consonants are marked to identify sound variations**	
Eg:	ṅ	- as in sing
	ñ	- as in signor
	t	- as in temple
	t	- as in thank you
	d	- as in mother (There is no '**d**' sound as in double in Pāli words throughout this booklet).

Appreciation

I would like to pay homage to Gōthama, the Buddha who delivered these discourses and his disciples who had preserved them until now. I would like to express my heartfelt gratitude and sincere thanks to Mrs. Bhadra Illangakoon and Mr. Harry Illangakoon (Sydney-Australia) who computerized and compiled this booklet at the initial stages. My thanks also should go to Prof. Amaradasa Liyanagamage who did editing Mr. Gayashan Elpitiya who did the cover. May they all be well and happy.

Ven. Kudagala Kovida

පුණ්‍යාණුමෝදනා

මෙම පිරිත් සූත්‍ර දේශනා කළ ගෞතම බුදුරජාණන් වහන්සේටත් මේ දක්වා ඒවා ආරක්‍ෂා කරගෙන ආ උන්වහන්සේගේ ශ්‍රාවක සමූහයාටත් නමස්කාර පූර්වක පුණ්‍යාණුමෝදනාව කරමි. මෙම පොත් පිංච මුල් පියවරේදී මනා ලෙස පරිගණක ගත කොට සකස් කර දුන් ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර භද්‍රා හා හැරි ඉලංගකෝන් යුවලට මුළු හදවතින්ම කෘතඥතාව පළ කරමි. මෙම පොත සංස්කරණය කර දුන් කැළණි විශ්ව විද්‍යාලයේ හිටපු මහාචාර්ය අමරදාස ලියනගමගේ මහතාටද, පිටකවරය නිර්මාණය කළ ගයාෂාන් ඇල්පිටිය මහතාටද, දහම් පඬුරක් ලෙස බෙදා දීමට මෙම පොත මුද්‍රණය කිරීමට සුවපත් භාවයට පත්වේවායි ප්‍රාර්ථනා කරමි.

කුඩාගල කෝවිද හිමි

"Wherever the Buddha's teachings have flourished,
either in cities or countrysides,
people would gain inconceivable benefits.
The land and people would be enveloped in peace.
The sun and moon will shine clear and bright.
Wind and rain would appear accordingly,
and there will be no disasters.
Nations would be prosperous
and there would be no use for soldiers or weapons.
People would abide by morality and accord with laws.
They would be courteous and humble,
and everyone would be content without injustices.
There would be no thefts or violence.
The strong would not dominate the weak
and everyone would get their fair share."

※ THE BUDDHA SPEAKS OF THE INFINITE LIFE SUTRA OF ADORNMENT, PURITY, EQUALITY AND ENLIGHTENMENT OF *THE MAHAYANA SCHOOL* ※

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of
Limitless Light!

~The Vows of Samantabhadra~

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

~The Vows of Samantabhadra
Avatamsaka Sutra~

DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.
Homage to Amita Buddha!

NAMO AMITABHA
南無阿彌陀佛

【斯里蘭卡文、英文對照:THE PROTECTIVE BLESSING 吉祥經‧三寶經‧慈愛經】

財團法人佛陀教育基金會　印贈
台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by
The Corporate Body of the Buddha Educational Foundation
11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.
Tel: 886-2-23951198 , Fax: 886-2-23913415
Email: overseas@budaedu.org
Website:http://www.budaedu.org

This book is strictly for free distribution, it is not for sale.

නොමිලයේ බෙදාදීම පිණිසයි.

Printed in Taiwan
5,000 copies; February 2014
SE002-11997